ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2017/07/21 |

## 2017 ජුනි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද.) (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2017 මැයි මාසයේ දී වාර්තා කළ සියයට 7.1 හි සිට 2017 ජුනි මාසයේ දී සියයට 6.3 දක්වා පහළ ගියේය. 2017 ජුනි මස ලක්ෂ්‍යමය උද්ධමනය කෙරෙහි ආහාර කාණ්ඩය මෙන්ම ආහාර නොවන කාණ්ඩයද දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස 2017 ජුනි මාසයේ දී පසුගිය මාසයේ පැවති සියයට 6.1 හි නොවෙනස්ව පැවතුණි.

මාසික වෙනස්වීම සැලකූ විට, ජා.පා.මි. දර්ශකය 2017 මැයි මාසයේ වාර්තා වූ දර්ශක අංක 121.8 සිට 2017 ජුනි මාසයේ දී දර්ශක අංක 123.4 දක්වා ඉහළ ගියේය. ආහාර කාණ්ඩයට අයත් අයිතමයන්හි මිල ගණන් ඉහළ යෑම, මෙම මාසික ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආහාර කාණ්ඩය තුළ එළවළු, සහල්, මාළු, අමු මිරිස්, රතුළූණු, කරවල (හාල්මැස්සන්), සහ කුකුල් මස් මිල ගණන් මාසය තුළ දී ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ, ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු (ගෘහ සේවක වැටුප් සහ

රියැදුරු වැටුප්); විවිධ භාණ්ඩ හා සේවා; සහ රෙදිපිළි හා පාවහන් උප කාණ්ඩයන්හි ඇතුළත් අයිතමවල මිල ගණන් ඉහළ ගියේය. මධ්‍යසාර පාන හා දුම්කොළ (පුවක්) උප කාණ්ඩයෙහි ඇතුළත් අයිතමවල මිල ගණන් ද 2017 ජූනි මාසය තුළ දී ඉහළ ගියේය. සෞඛ්‍ය උප කාණ්ඩයෙහි මිල ගණන් මාසය තුළ දී පහළ ගියේය. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; සහ ආපනශාලා සහ හෝටල්; උප කාණ්ඩයන්හි මිල ගණන් මාසය තුළ දී නොවෙනස්ව පැවතිණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන ජා.පා.මි. දර්ශකයෙහි මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2017 මැයි මාසයේ දී පැවති සියයට 4.7 හි සිට 2017 ජූනි මාසයේ දී සියයට 4.1 දක්වා පහළ ගියේය. මෙම පහළ යෑමට නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම, බලශක්ති සහ ප්‍රවාහන කාණ්ඩයන් හැර අනෙකුත් අයිතමවල මිල ගණන් සුළු වශයෙන් ඉහළ යෑම හේතු විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ද 2017 මැයි මාසයේ දී වාර්තා වූ සියයට 6.4 හි සිට 2017 ජූනි මාසයේ දී සියයට 6.1 දක්වා පහළ ගියේය.



**ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම**
**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජුනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |
| | මාර්තු | 110.0 | -0.7 | 2.2 | 2.4 |
| | අප්‍රේල් | 111.6 | 1.5 | 4.3 | 2.6 |
| | මැයි | 113.7 | 1.9 | 5.3 | 2.7 |
| | ජුනි | 116.1 | 2.1 | 6.4 | 3.1 |
| | ජූලි | 115.2 | -0.8 | 5.8 | 3.4 |
| | අගෝස්තු | 113.3 | -1.6 | 4.5 | 3.6 |
| | සැප්තැම්බර් | 113.5 | 0.2 | 4.7 | 3.8 |
| | ඔක්තෝබර් | 114.7 | 1.1 | 5.0 | 4.0 |
| | නොවැම්බර් | 116.6 | 1.7 | 4.1 | 4.0 |
| | දෙසැම්බර් | 118.0 | 1.2 | 4.2 | 4.0 |
| 2017 | ජනවාරි | 119.3 | 1.1 | 6.5 | 4.6 |
| | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 | 5.1 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 | 5.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 | 6.0 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 | 6.1 |
| | ජුනි | 123.4 | 1.3 | 6.3 | 6.1 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව